www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එඩ්වර්ඩ් ස්නෝඩන් ආරක්ෂා කරනු!

## සසප/සසජාතශි කොලඹදී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වයි

## SEP/IYSSE meeting in Colombo: Defend Edward Snowden!

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2013 ජූලි 4**

ඇමරිකානු බුද්ධි අංශවල දැවැන්ත ඔත්තු බැලීමේ මෙහෙයුම් ගැන එළිදරව් කල එඩ්වර්ඩ් ස්නෝඩන් ආරක්ෂා කිරීමේ ප්‍රසිද්ධ රැස්වීමක් කොලඹ දී පැවැත්වීමට සමාජවාදී සමානතා පක්ෂය හා සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර තරුනයෝ සහ ශිෂ්‍යයෝ සංවිධානය විසින් කටයු යොදා ඇත.

ජාතික ආරක්ෂක ආයතනයේ හිටපු සේවක ස්නෝඩන් අපරාධකරුවෙකු ලෙස සලකා අත්අඩංගුවට ගැනීමේ එක්සත් ජනපද ගෝලීය මෙහෙයුමක ඉලක්කය බවට පත්ව සිටී. ඔහු කල එකම "අපරාධය" වන්නේ ජාතික ආරක්ෂක ආයාතනය විසින් එක්සත් ජනපදයේ හා ලොවපුරා ජනතාව දැවැන්තව සහ නීති විරෝධීව විද්‍යුත් නිරීක්ෂනයන්ට භාජනය කිරීම එළිදරව් කිරීමය. දුරකථන ඇමතුම්, ඊමේල් හා අනෙකුත් විද්‍යුත් පනිවුඩ සහ අන්තර්ජාල ක්‍රියාකාරීත්වයන් ක්‍රමානුකූලව පරීක්ෂාවට ලක් කිරීම ඊට ඇතුලත්ය

ඔහුගේ නිර්භීත ක්‍රියාව නිසා ස්නෝඩන් මුහුන දී සිටින්නේ බරපතල අන්තරායකට ය. කොන්ග්‍රස් සභාවේ සහ මාධ්‍යවල පිටුබලය ලබන ඔබාමා ආන්ඩුව ඔත්තු බැලීමේ චෝදනා ඔහුට ඉදිරිපත් කර ඇති අතර ඔහුගේ විදේශ ගමන් බලපත්‍රය අවලංගු කොට ඇත. ඔහු දැන් මොස්කව් ගුවන් තොටුපොලෙන් එළියට යාගත නොහැකිව සිර වී සිටින අතර දේශපාලන රැකවරනයක් අපේක්ෂා කරයි. තවදුරටත් තොරතුරු එළිදරව් කිරීම වැලැක්වීම සඳහා ඔහු නිහඬ කිරීමට සහ සෙසු අය ඔහුගේ ආදර්ශය අනුගමනය කිරීමෙන් වැලැක්වීම සඳහා ඔවුන්ව ත්‍රස්ත කිරීම සඳහා ද කල හැකි හැම දෙයක් ම එක්සත් ජනපදය කරයි.

එඩ්වර්ඩ් ස්නෝඩන් මෙන් ම, ඒ හා සමානව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ සාපරාධී ක්‍රියාවන් එළිදරව් කල බ්‍රැඩ්ලි මැනින් සහ ජුලියන් අසාන්ජ් ආරක්ෂා කිරීමේ වගකීමක් ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියට තිබේ. ඔවුන් ආරක්ෂා කිරීම ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තරව ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරවලට එරෙහි අරගලයෙන් වෙන් කල නොහැකිය. ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකීමට උත්සුකවන කම්කරුවන්, තරුනයන් සහ සෙසු කවර හෝ අයගෙන් මෙම වැදගත් රැස්වීමට සහභාගිවන ලෙස අපි ඉල්ලා සිටිමු .

**ස්ථානය:** **මහජන පුස්තකාල ශ්‍රවනාගාරය, කොලඹ 7**

**දිනය සහ වේලාව:** **ජූලි 12 වෙනි සිකුරාදා** **සවස 4 ට**

**සමාජවාදී සමානතා පක්ෂය / සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර තරුනයෝ සහ ශිෂ්‍යයෝ**